

# මහීෂ සහ ධනුෂගේ මධුර ධ්වනි

ඔස්ට්‍රේලියාවේ විප්‍රවාසී ශ්‍රී ලාංකේය සම්භවයක් ඇති අපගේ ජන ප්‍රජාව පිළිබඳව නිතර කතා කරන්නෙමු. ඔවුන් අතරින් අපගේ සංස්කෘතිකාංග බහු සංස කෘතික වටපිටාවක් අගයන මෙරට ප්‍රධාන ජන ප්‍රවාහයට මුසු කිරීමට යත්න දරන්නන් පිළිබඳවත්, එම දේපල අප අප අතරම බෙදා හදා ගන්නට කැප වෙන්නවුන් පිළිබඳ වත් සතුටින් කතා කරන්නෙමු. මේ අංශ දෙකේදීම මුල් තැන හිමි වන්නේ මෙරටට



සංක්‍රමණය වූ මුල් පරපුරයි. දෙවැනි, තෙවැනි පරම්පරාවලට මේ සංස්කෘතිකාංග කොතෙක් දුරට සම්ප්‍රේෂණය වේ දැයි සැකයකි. එහෙත් ඒ සැකය දුරලමින් ඒ සඳහා යොමුවන අපගේ දෙවන පරම්පරාවේ දූ පුතුන් නොයෙක් කලා කටයුතුවල දායක වනු දැක්ම සතුටකි. මේ අතරින් පෙරමුණ ගන්නේ දැරියන් බව කිවහොත් මුසාවක් නොවේ. විශේෂයෙන්ම විශාල පිරිසක් නර්තනය සඳහා දායක වන අතර ඉන් බහුතරය දැරියන්ය. එහෙත් ඒ අතරට මහත් උනන්දුවෙන් සිය නිසඟ කුසලතාවය ඔප් නංවමින්, නරන්තර අභ්‍යාසයෙහි යෙදෙමින්, ඉගෙනුමෙන් ලද ව්‍යුත්පත්තිය දියුණු කරමින් ඉදිරියට ම යන පුතුන් දෙදෙනෙක් මේ අතරින් කැපී පෙනෙයි. ඒ මහීෂ සහ ධනුෂ ගමගේ සොයුරන් දෙපළයි.

2019 පෙබරවාරි 24 දා "වැන්ඩිලර් තියටර්" හි පැවැත්වෙන "මධුර ධ්වනි" ප්‍රසංග යෙන් සිය සුරුකම් වේදිකාප්‍රාප්ත කිරීමට සැරසෙන ගමගේ සොයුරන් පිළිබඳව කෙටියෙන් හෝ සටහන් තැබීම සහත් සතුටක් ගෙන දෙන්නකි. මියැසියට සීමා නොවී ඉගෙනුමටත් ක්‍රිකට් ක්‍රීඩාවටත් එකසේ හපන්කම් පානා මෙවන් පුතුන් දෙපළකගේ ප්‍රසංගයක් නැරඹීම ඊටත් වඩා සතුට එළ වන්නකි.

199 වසරේ සිංගප්පූරුවේදී උපත ලැබූ මහීෂ 2005 දී මෙරටට සංක්‍රමණ වීමෙන් පසුව වයස අවුරුදු අටේ පටන්ම තරුපති සංගීතවේදියාණන්ගෙන් සිංහල හා උතුරු ඉන්දීය සංගීතය හැදෑරුවේය. ඉන් අනතුරුව ගිටාර් වාදනයට යොමු වන්නේ සිය පිය පස ඥාතීන්ගේ මියැසි වටපිටාවක් ඇතිවය.

දැනට ඔහු ඕස්ට්‍රේලියන් මියුසික් එග්සැමිනේෂන් බෝර්ඩ් (Australian Music Examination Board) විභාගයේ සයවැනි ශ්‍රේණියට සූදානම් වෙමින් සිටියි. සිය පාසැලේ ප්‍රධාන සංගීත කණ්ඩායමට "ලීඩ්" සහ "ජෑස්" වාදනයෙන් දායක වන මහීෂ බටහිර ශාස්ත්‍රීය කණ්ඩායමට ද (Western Classical Guitar) සම්බන්ධය.

වසර 2016 දී මෙල්බන් හි "සෙරන්ඩිබ් එවෙ ්ඩ්" උළෙලේදී Young entertainer of the year (වසරේ රසික හද දිනාගන්නා) අනුශූරතාවය දිනාගත් මහීෂ මුලින්ම මෙල්බන්හි "ලක්හඩ" ගුවන් විදුලියේ "ළමා හුරුව" සහ චැනල් 31 ළමා වැඩසටහන් සඳහා සහභාගී විය. අනතුරුව "ස්කැට්ස්" සංවිධානයේ "ප්‍රණාම" සිසිර දිසානායකගේ "අතුරු මිතුරු", තරුපති මුණසිංහගේ "හඳුනාගත්තොත් ඔබ මා", "සෝබාව දේ", "කෝකිල නාදේ", ජන ගී ප්‍රසංග වැනි ප්‍රසංග සඳහා ඒකල ගායනා මෙන්ම සමූහ හා යුග ගායනාවලට ද ඉදිරිපත් විය. එමෙන්ම "මෙල්බන් ටැලන්ට් ෂෝ" සුනිල් සරත් පෙරේරා උපහාර උළෙල, එච්.එම්. ජයවර්ධන උපහාර උළෙල, සිසිර දිසානායක උපහාර උළෙල වූ "සිසිර සරණිය" මෙන්ම සරිනි දිසානායකගේ " සිනාවී" ප්‍රසංගයටද සිය හඬ දායක කරමින් මෙරට ප්‍රජා මියැසි වේදිකාවල සිය ප්‍රභාව විහිදුවීය.

පණ්ඩිත් අමරදේව, විශාරද නන්දා මාලිනී, විශාරද දීපිකා ප්‍රියදර්ශණී, සුනිල් එදිරිසිංහ, සංගීත් නිපුන් සනත් නන්දසිරි වැනි ප්‍රවීණයින්ට අත්වැල් ගායනා ගයමින් ද ප්‍රියා සූරියසේන ශිල්පියාගේ ප්‍රසංගයක ගිටාර් වයමින් ද දායක වුණ මහීෂ සුනිල් එදිරිසිංහ විශාරද අනුරාධා නන්දසිරි වැනි ශිල්පීන් සමග යුග ගායනා ඉදිරිපත් කිරීමට වරම් ලැබීය. බණ්ඩාර ඇහැලියගොඩ ප්‍රවීණයා රචනා කර තරුපති මුණසිංහයන් සංගීතවත් කළ "මට මගේ නෑසියන්" ගීතය "නිම්තෙරක්" සහ "රසෝඝා" ප්‍රසංග වල සුනිල් එදිරිසිංහයන් සමග ගැයීමට ලැබීම මහීෂ ලත් විශේෂ වරප්‍රසාද විය.
සිසිර දිසානායක රචානකර තරුපති මුණසිංහ සංගීතවක් කළ "අල්ලාගෙන මගෙ පුංචි අතින්" ගීතය ගයමින් මුලින් ම ස්වත න්ත්‍ර ගීත ගැයීම ඇරඹූ මහීෂගේ අනෙක් ස්වතන්ත්‍ර ගීත වන්නේ "මගේ මව්බිම" (සුනිල් සරත් පෙරේරා/තරුපති මුණසිංහ), "ජීවිතය ඔබයි" (දර්ශන රුවන් දිසානායක), "මගේ අම්මා" (පූජ්‍ය රඹුක්කන සිද්ධාර්ථ හිමි/අරුණ ගුණවර්ධන) , "මහා බුදු ගුණ සාගරේ" (කුමාරදාස සපුතන්ත්‍රි/ආචාර්ය රෝහණ වීරසිංහ), "පුරසඳ" (සුනිල් ආර් ගමගේ/ ආචාර්ය රෝහණ වීරසිංහ), "ඔබ මලක්" (රත්න ශ්‍රී විජේසිංහ/දර්ශන වික්‍රමතුංග), "සියක් පද වැල්" (පූජ්‍ය දිද්දෙනිපොත ධම්මානන්ද හිමි/චන්ද්‍රදාස බෝගොඩ) යන ගීතයි.

දැනට මොනෑෂ් සරසවියේ "බයෝ මෙඩිකල් සයන්ස්" (Bio Medical Science) උපාධිය හදාරන විද්‍යාර්ථයකු වන මහීෂ ක්‍රිකට් ක්‍රීඩාවේ දක්ෂ දඟ පන්දු යවන්නෙකි. මෙම වසරේ ප්‍රිමියර් ලීග් (premier League) තරඟාවලිය සඳහා "කැසී සවුත් මෙල්බර්න්" (Casey South Melbourne) කණ්ඩායමෙන්



ක්‍රීඩා කළ ඔහු පාසැලේ ක්‍රිකට් කණ්ඩායමේ නායකයාය.

වසර 2003 දී මෙලොව එළිය දුටු ධනුෂ ද සිය සොයුරාගේ ම අඩි පාරේ යමින් තරුපති මුණසිංහයන්ගෙන් සංගීතය හැදෑරූ අතර පියානෝවත්, සර පුවරුවත් ඔහුගේ මූලික වාද භාණ්ඩ ලෙස ප්‍රගුණ කරයි. Australian Music Examination Board හි පියානෝ හා වයලින් වාදනයෙන් හතර වන ශ්‍රේණිය සමත් වෙමින් "නොසල් හයි ස්කූල්" (Nossal High School) හි අධ්‍යාපනය ලබන අතරේ "ස්ට්‍රිං ඔකෙස්ට්‍රා" (String Orchestra) සහ "ගිටාර් එන්සෙම්බල්" (Guitar Ensemble) වල වාදන සඳහා සම්බන්ධ වෙයි. පෙරදිග වයලීනය වෙනුවෙන් ධනුෂට ගුරුහරුකම් දෙන්නේ ප්‍රවීණ වයලින් වාදන ශිල්පී ඩී.ඩී. ගුණසේනයන් විසිනි.

ගායනයෙන්ද හපන්කම් දක්වන ධනුෂ දැනට "පිනි පබලු වැටී" (පූජ්‍ය කොඩිකාරගොඩ සුනීත හිමි/තරුපති මුණසිංහ) සහ "රන් කිරි කටගාලා" (සිසිර දිසානායක/දර්ශන වික්‍රමතුංග) යන ස්වතන්ත්‍ර ගී ගායනා කර ඇත්තේය. තරුපති මුණසිංහයන්ගේ ඉහත කී ප්‍රසංග වලට ගායන්යෙන් දායක වූ ධනුෂ ප්‍රවීණයන්ගේ ප්‍රසංග සඳහාද අත්වැල් ගායනා කළේය.

දක්ෂ පිතිකරුවෙකු ලෙස වයස 12 න් පහළ සිට 15 පහළ දක්වා ක්‍රිකට් කණ්ඩායම්වල දැක්වූ දක්ෂතා නිසාම වික්ටෝරියානු ප්‍රාන්ත කණ්ඩායමේ සංචිතයට ද ධනුෂ ඇතුලත් කරගනු ලැබීය. මහීෂ මෙන්ම ධනුෂ ද "ප්‍රිමියර් ලීග්" තරගාවලිය සඳහා එම කණ්ඩායමට ම ආරම්භක පිතිකරුවකු සේ ක්‍රීඩා කරයි.

සිය පුතුන් හට හැකියාවන් දායද කිරීමට මතු නොව ඒ හැකියාවන් ඔප් නංවා ගැනීමට යොමු කරමින්, දිරි දෙමින් වෙහෙ සෙන ගමගේ දෙමාපියන් වෙත අප ස්තූතිය පිරිනැමිය යුතු වන්නේ අපගේ ජන ප්‍රජා වටත් ප්‍රධාන ප්‍රවාහයටත් එම පුතුන්ගෙන් ලැබෙන දායකත්වය නිසයි. ඔවුනගේ පියාණන් වන ශාන්ත ගමගේ මහත්මා අදාල තොරතුරු ලබාදෙමින් අනතුරුව, තරුපති මුණසිංහ, සුනිල් එදිරිසිංහ, ඩී.ඩී ගුණසේන, අසංක ලියනගේ, ප්‍රදීප් ගමගේ, නීල් ගමගේ, ආලෝකා ලියනගේ, ක්‍රිස්ටි අමරනාත් ප්‍රනාන්දු, දර්ශන රුවන් දිසානායක, අරුණ ගුණවර්ධන, යන පිරිසටත් ක්‍රිකට් ක්‍රීඩාවට අත දුන් අතුල සමරසේකර, මංජුල මුණසිංහ, ප්‍රභාත්/නිශ්ශංක, සංජීව වීරසිංහ, සුරන්ජිත් සිල්වා, ඔවන් මාතාවු (Owen Mathau), වර්නන් තිසේරා ඇතුළු සියලු පුහුණුකරුවන්ටත් ස්තූතිය පළ කළේය.

**අපි මහීෂ, ධනුෂ සොයුරන්ට සුබ පතමු !**